# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Services, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:**(94) 011- 2694560** Telephone
ෆැක්ස් தொலைநகல்:**(94) 011- 2692254** Fax
ඊ-මේල් மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site


---

මගේ අංකය / எனது இல / My No: PS/GT/2020 (III වෙළුම)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.01.13

**<u>රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020</u>**

උක්ත වැඩසටහන යටතේ ස්ථිර පත්වීමක් ලැබූ නිලධාරීන්ගේ නව සේවා ස්ථාන මේ වන විට MISCO පද්ධතියට ප්‍රවේශ වී දැනගත හැකි වේ. එසේම 2022/04/01 දිනට ස්ථිර පත්වීම් ලැබීමට නියමිත නමුත් ස්ථිර පදනමින් 2022.01.03 දින සිට සේවා ස්ථානවලට අනුයුක්ත කරන ලද අභ්‍යාසලාභීන්ගේ නව පුහුණු ස්ථානවලට අදාල ලිපි ද මේ වන විට දිස්ත්‍රික් ලේකම්වරු වෙත යැවීමට කටයුතු කර ඇත.

02. ඒ අනුව මෙම නිවේදනය අදාළ වනුයේ පහත සඳහන් අභ්‍යාසලාභී කාණ්ඩ තුන සඳහා පමණක් බව අවධාරණය කරනු ලැබේ.

I. 2021.12.31 දිනට වසරක පුහුණුව සම්පූර්ණ කර මෙතෙක් සිය සේවා ස්ථානය MISCO පද්ධතියේ දර්ශනය නොවූ අභ්‍යාසලාභීන්

II. 2021.12.31 දිනට වසරක පුහුණුව සම්පූර්ණ නොකළ නමුත් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති මෙතෙක් ස්ථිර සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීමේ ලිපියක් නොලද අභ්‍යාසලාභීන්

III. ඉහත කුමන හෝ කාණ්ඩයකට අයත් වුවද/ නොවුවද, පළාත්/ පළාත් පාසල් සහ ජාතික පාසල් ලැයිස්තුවල වැරදි ලෙස ඇතුළත් කර ඇති අභ්‍යාසලාභීන් (මෙතෙක් පළාත් සභාවක/ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලිපියක් ලබා නොමැති හෝ පත්වීම් ලබාදීමේ ක්‍රියාවලියට ඇතුළත්ව නොමැති)

03. ඉහත අභ්‍යාසලාභී නිලධාරි කාණ්ඩ තුනට අදාලව පැන නැගී ඇති ගැටලු අනාවරණය කරගෙන කඩිනමින් නිරාකරණය කිරීම සඳහා Google පෝරමයක් හඳුන්වා දෙනු ලැබේ.

**සබැඳිය (Link) :** https://bit.ly/3GoqRi9

04. ඔබගේ Gmail ලිපිනය භාවිත කර එම පෝරමය වෙත ඇතුලු වී අදාළ තොරතුරු ඇතුළත් කිරීම මැනවි. ඒ සඳහා 2022.01.14 දින සිට 2022.01.17 දින මධ්‍යම රාත්‍රී 12 දක්වා කාලය දෙනු ලැබේ. ඉහත ගැටලු සහිත නිලධාරීන් මේ වන විට විවිධ මාර්ග ඔස්සේ මේ සම්බන්ධ ලිඛිත සහ වාචික විමසීම් සිදුකර ඇති අතර එම සෑම නිලධාරියෙකුම ද ඉහත Google පෝරමයට තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය